# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### (01) **වැඩ අධිකාරී (විදුලි)** II **ශ්‍රේණිය** [U-MN 2(II)]

සුදුසුකම් :- 1. තාක්ෂණික විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතික පත්‍රය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුදු හතරක (04) පලපුරුද්දක් තිබීම.

සටහන :- ඉහත තාක්ෂණික විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ වසර හතරෙහි (04) පුහුණු කාලසීමාව ඉල්ලුම් කරනු ලබන පලපුරුද්දට අදාළ නොවේ.

හෝ

2. ජාතික තාක්ෂණික සහතිකය හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර දහයක (10) පලපුරුද්දක් තිබීම.

වැටුප් පරිමාණය :- **රු. 61,275 - 18 X 890 - 77,295** (මාසික) [U-MN 2(II)]

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### (02) **තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය)** III **ශ්‍රේණිය** [U-MT 1(III)]

සුදුසුකම් :- (i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක් වරක දී විෂයයන් තුනකින් සමත්ව තිබීම.

සහ

(ii) (අ) තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් ආයතනයකින් හෝ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකින් හෝ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාළව, ජාතික වෘත්තිය නිපුනතා (National Vocational Qualification) 5 වෙනි මට්ටමට (NVQ Level 5) නොඅඩු නිපුනතා සහතිකපත්‍රයක් ලබා තිබීම.

හෝ

(ආ) තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ඉහත (ii) (අ) කොටසෙහි සුදුසුකම්වලට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාළව ලබා ගත් තාක්ෂණික සුදුසුකම් සමඟ පිළිගත් ආයතනයකින් ලබාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය :- **රු. 51,095 - 7 X 540 ; 10X640 - 61,275** (මාසික) [U-MT 1(III)]

බඳවා ගැනීම :- ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

### (03) **මහජන සෞඛ්‍ය පරීක්ෂක** (III **ශ්‍රේණිය**) [U-MT 1(III)]

සුදුසුකම් :- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගයෙන් සමත්වීම.

වැටුප් පරිමාණය :- **රු. 51,095 - 7 X 540; 10X640 - 61,275** (මාසික) [U-MT 1(III)]

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මගින්

### (04) **ශිල්ප ප්‍රදර්ශක (විදුලි)** II **ශ්‍රේණිය** [U-MN 1(III)]

සුදුසුකම් :- 1. අදාළ ක්ෂේත්‍රයේ පලපුරුද්ද ලබා තිබීම.

සහ

2. විශ්වවිද්‍යාල/රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක පුහුණු ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසර පහළොවක (15) පලපුරුද්දක් ලබා තිබීම.

හෝ

3. විශ්වවිද්‍යාල/රජයේ සේවයේ හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පුහුණු විශේෂ ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර තුනක (03) පලපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය :- **රු. 49,475 - 17 X 540 - 58,655** (මාසික) U-MN 1(III)

බඳවා ගැනීම :- ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### (05) **පොත් බැඳුම්කරු** (III **ශ්‍රේණිය**) [U-PL 3(III)]
### (06) **වැද්දුම්කරු** (III **ශ්‍රේණිය**) [U-PL 3(III)]

ඉහත අංක 05 සහ 06 තනතුරු සඳහා

සුදුසුකම් :- ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. [පාඨමාලාවට අදාළ ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.]

වැටුප් පරිමාණය :- **රු. 48,005 - 16 X 490 - 55,845** (මාසික) U-PL 3(III)

බඳවා ගැනීම :- වෘත්තිය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### (07) **නිවාස භාරකරු සහ අරක්කැමි** (III **ශ්‍රේණිය**) [U-PL 2(III)]

සුදුසුකම් :- 1. අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ තනතුරට අදාළව තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. [පාඨමාලාවට අදාළ ජාතික වෘත්තිය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.]

හෝ

2. අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමඟ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය :- **රු. 44,575 - 16 X 490 - 52,415** (මාසික) U-PL 2(III)

බඳවා ගැනීම :- වෘත්තිය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

වයස :- අවුරුදු 18 ට නොඅඩු සහ **45 ට නොවැඩි** විය යුතුයි.

මෙම තනතුරු සඳහා මූලික වැටුපට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

අයදුම්පත් https://ou.ac.lk යන විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියෙන් (**https://ou.ac.lk/staff-resources/ ys Establishment Division** යටතේ ඇති **Application Non-academic**) හෝ මෙම විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන ආයතන අංශයට පැමිණ ලබා ගත හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ යන ලිපිනයට 2026.06.05 **දින හෝ එදිනට පෙර ලැබෙන සේ** එවිය යුතුය.

රාජ්‍ය රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත් සමඟ සහතිකවල ජායා පිටපත් ද අමුණා එවිය යුතුය. **ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපහැදිලි බව, සහතිකවල ජායා පිටපත් අමුණා නොතිබීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.** කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ
2026.05.17